## පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2023

## ආර්ථික විද්‍යාව I - පිළිතුරු පත්‍රය

## 12 ශ්‍රේණිය

| | | | | |
|---|---|---|---|---|
| **1) 3** | **11) 5** | **21) 1** | **31) 2** | **41) 1** |
| **2) 4** | **12) 4** | **22) 4** | **32) 5** | **42) 3** |
| **3) 2** | **13) 5** | **23) 5** | **33) 1** | **43) 4** |
| **4) 4** | **14) 3** | **24) 2** | **34) 3** | **44) 4** |
| **5) 4** | **15) 4** | **25) 1** | **35) 1** | **45) 4** |
| **6) 3** | **16) 3** | **26) 4** | **36) 2** | **46) 3** |
| **7) 1** | **17) 2** | **27) 3** | **37) 2** | **47) 3** |
| **8) 5** | **18) 4** | **28) 4** | **38) 5** | **48) 4** |
| **9) 1** | **19) 5** | **29) 4** | **39) 4** | **49) 4** |
| **10) 2** | **20) 4** | **30) 4** | **40) 4** | **50) 3** |

1)

i. කුමක් කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කළ යුතු ද?
කෙසේ නිෂ්පාදනය කළ යුතු ද?
කා සඳහා නිෂ්පාදනය කළ යුතු ද? (ලකුණු 03)

ii. හිඟකම යනු අසීමිත මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව සම්පත්වල පවතින සීමිත බවයි. (ලකුණු 01)

ආර්ථිකයක හිඟකමක් පවතින විට එම සම්පත්වල විකල්ප ප්‍රයෝජන රාශියක් ඇති වේ. ඒ විකල්ප ප්‍රයෝජන සියල්ල එකවර සපුරාගත නොහැකි නිසා තේරීම් කිරීමට යාමේදී කැපකිරීමක් හටගැනීම තුළින් ආවස්ථික පිරිවැයක් ඇති වේ. (ලකුණු 02)

එහිදී කැප කරන ලද ඊළඟ හොඳම විකල්පයේ වටිනාකම ආවස්ථික පිරිවැය බවට පත්වේ. (ලකුණු 01)

නමුත් හිඟකමක් නොමැතිවිට තේරීම කිරීමට අවශ්‍ය නොවේ. තේරීම් කිරීමට අවශ්‍ය නොවන නිසා කැපකිරීමක් හට නොගනී ඒ නිසා ආවස්ථික පිරිවැයක් ඇති නොවේ. (ලකුණු 02)

iii. සංඥා සැපයීම
සානුබල සැපයීම
සලාකනය කිරීම (ලකුණු 03)

iv. ශ්‍රම විභජනය තුළින් ශ්‍රමිකයන් ශ්‍රම නිපුණතාවයට පත් කරනු ලබයි. සියලු කාර්යයන් කරනවා වෙනුවට එකම කාර්යයක නිරතවීමෙන් ලබන නිපුනතා එයට හේතු වේ. (ලකුණු 01)

මෙහිදී නිෂ්පාදන ඵලදායිතාවය යන්නෙන් අදහස් වන්නේ යෙදවුමකින් ලබාගත හැකි නිමැවුම් ප්‍රමාණයයි. (ලකුණු 01)

ශ්‍රමිකයන්ගේ ශ්‍රම විශේෂීකරණය ශ්‍රමයේ පමණක් නොව ප්‍රාග්ධන සම්පත්වලද ව්‍යවසායකත්වයේදී ඵලදායිතාවය ඉහළ නංවයි.අඩු කාලයක් තුළ වැඩි නිමැවුමක් බිහිකරමින් ශ්‍රම ඵලදායිතාවය ඉහළ යන අතර එය නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට හේතු වේ. එවිට ව්‍යවසායක් බුක්ති විදින්නේ ද ඉහළ ඵලදායිතාවයක් තුළින් ඉහළ ලාභයකි. අනෙක් අතට ප්‍රාග්ධන සම්පත් මනාව උපයෝජනය වීමෙන් කාර්යක්ෂමව වැඩ කෙරෙන නිසා ප්‍රාග්ධන සම්පත්වලද ඵලදායිතාවය වැඩි වේ.

(ලකුණු 02)


v. මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක වීම
දේපළ හිමිකම පෞද්ගලික අංශය සතුවීම
පෞද්ගලික ව්‍යවසායකත්වය පැවතීම
ලාභය සානුබල ලෙස ක්‍රියාත්මක වීම
පෞද්ගලික අංශය නිපදවන භාණ්ඩ පවතින විට තේරීමේ නිදහස පැවතීම
පෞද්ගලික අංශයේ තරගකාරීත්වය පැවතීම

ආදී කරුණු මිශ්‍ර ආර්ථිකවල පවතින බැවින් එම වෙළඳපොළ ආර්ථික පද්ධතිවලට සමාන කොට ලියා දැක්විය යුතු ය.

(ලකුණු 04)

**2)**

i. සැපයුම වැඩිවීම යනු සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවරව පවතින විටක සැපයුමට බලපාන වෙනත් සාධකයක් වෙනස්වීම නිසා සැපයුම වක්‍රය ම දකුණට විතැන් වීම හෙවත් සැපයුම ඉහළ යාමයි. එය පහත අයුරින් නිරූපණය කළ හැකි වේ.




(ලකුණු 02)

ඒ සඳහා බලපාන සාධක :

සැපයුම්කරුවන් සංඛ්‍යාව ඉහළ යාම
රජය නිෂ්පාදන සහනාධාර ලබාදීම
නිෂ්පාදන පිරිවැය අඩුවීම
තාක්ෂණය දියුණුවීම
ආදේශන භාණ්ඩ මිල පහළ යාම

(ආදී කරුණු 03කට ලකුණු 01 බැගින් ලකුණු 03 යි)

ii. (අ)

| මිල | ඉල්ලුම් ප්‍රමාණය (මිලියන) | පැහැදම |
|---|---|---|
| **5 500** | **4** | **22 000** |
| **4 125** | **8** | **33 000** |

රුපියල් මිලියන **11 000** (ලකුණු 01)

$$Edp = \frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q}$$

$$-4 = \frac{\Delta Q}{1375} \times \frac{5500}{4}$$

$$4 = \Delta Q$$ (ලකුණු 01)

පැහැදම රුපියල් මිලියන 11 000 කින් වැඩි වී ඇත. (ලකුණු 01)

(ආ) පාරිභෝගිකයන්ගේ , මිල අඩු වීමේ වාසිය = රු: 1 375

පෙර මිලදීගත් ප්‍රමාණය මිලියන = 4


දැන් මිලදී ගන්නා ප්‍රමාණය මිලියන = 8

පාරිභෝගික අතිරික්තයේ වැඩිවීම $= \frac{(8+4)1\,375}{2}$

= රුපියල් මිලියන **8 250.00** (ලකුණු 02)


iii. නිෂ්පාදන සාධක වෙනත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා පහසුවෙන් සංචලනය කළ නොහැකි වීම.
මිල වෙනස්වීමකදී කෙටි කාලයේදී සැපයුම් තීරණ වෙනස් කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම
තොග පවත්වාගෙන යාමේ හැකියාව නොමැති වීම
අතිරේඛ නිෂ්පාදන ධාරිතාවක් නොපැවතීම
කල් නොපවත්නා නෂ්‍යය වන භාණ්ඩයක් වීම
විරල යෙදවුම් භාවිත කර නිපදවීමට සිදුවීම (ලකුණු $1 \times 4$)

iv. (අ)



සමතුලිත මිල වැඩි වේ
සමතුලිත ප්‍රමාණය අඩු වේ (ලකුණු 02)

(ආ) බිත්තර සැපයුම අඩුවන විට සැපයුම වක්‍රය වමට විතැන් වේ, බිත්තර ඉල්ලුම වැඩිවන විට ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ. සැපයුමේ අඩුවීම හෝ ඉල්ලුමේ වැඩි වීම දී නොමැත.





මේ නිසා සමතුලිත මිල අනිවාර්යයෙන් ම වැඩි වේ. සමතුලිත ප්‍රමාණය වෙනස් වීම අවිනිශ්චිත වේ. (ලකුණු 03)

**3)**


i. රජය උපරිම මිලක් නියම කරනු ලබන්නේ පාරිභෝගිකයන්ට වාසියක් අත්කර දීමේ අරමුණින් ය. එය සඵල ප්‍රතිපත්තියක් වන්නේ එය සමතුලිත මිලට වඩා අඩු මිලක් නියම කළ විට දී ය. එය භාණ්ඩයක් වෙළඳපොළ තුළ අලෙවි කළ යුතු උපරිම මිල අගවන අතර එම මිලට වඩා වැඩි මිලකට භාණ්ඩය අලෙවි කිරීම තහනම් බව අගවයි. (ලකුණු 01)

එය එසේ තිබියදී රජයේ නීත්‍යානුකූල මිල සීමාව ඉක්මවා වංක වෙළඳුන් නීති විරෝධී මිලකට එම භාණ්ඩ අලෙවි කිරීම කළු කඩ මිල වන අතර එමගින් පාරිභෝගිකයාට ලැබුණු වාසිය මෙම වංක වෙළඳුන් අවාසියක් බවට පරිවර්තනය කරනු ලබයි. (ලකුණු 01)




ඉහත ප්‍රස්තාරයේ උපරිම මිල $P_1$ වන අතර සීමිත සැපයුම වෙළඳුන් $P_3$ වැනි මිලකට අලෙවි කරයි නම් එය කළු කඩ මිල ලෙස හඳුනාගත හැකිය. (ලකුණු 02)

ii. වෙළඳපොළ සමතුලිතය සම්පත් බෙදියාමේ කාර්යක්ෂමතාවය ඇති කරනු ලැබුවද රජයක් නිෂ්පාදකයන්ට ලබාදෙන ඒකක සහනාධාරයක් නිසා ආන්තික ප්‍රතිලාභවලට වඩා ආන්තික පිරිවැය වැඩි කරමින් සම්පත් බෙදීයාමේ අකාර්යක්ෂමව කරනු ලබයි. එය එලෙස සිදු වන්නේ වෙළඳපොළ තුළ අධි නිෂ්පාදනයක් හෙවත් අකාර්යක්ෂම නිමැවුම් මට්ටමක් ඇති වන බැවිනි. අනෙක් අතට පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයේ සිදුවන වැඩි වීමට වඩා වැඩි පිරිවැයක් රජය විසින් සහනාධාර පිරිවැය ලෙස දරණ නිසා සමාජයට දැරීමට සිදුවන පිරිවැය වැඩි කරමින් අහිමිවන සුබසාධනයක් ඇති කරනු ලබයි. (ලකුණු 02)



ඉහත සාමාන්‍ය භාණ්ඩයකට ලබාදෙන සහනාධාරයක් නිසා අභිමිවන සුබසාධනය $A$ වේ. එහිදී $Q_2$ සිට $Q_3$ දක්වා අධි නිෂ්පාදනය බිහි වී ඇත. (ලකුණු 02)

iii. රජයට ඉහළ බදු ආදායමක් උපයාගැනීමට අවශ්‍ය වේ නම් අනම්‍ය භාණ්ඩ මත බදු අය කළ යුතු වේ. එවිට බදු ආදායම වැඩි කර ගත හැකි වේ. බද්ද නිසා භාණ්ඩයේ මිල ඉහළ යන ප්‍රතිශතය වඩා අඩු ප්‍රතිශතයක් ඉල්ලුම් ප්‍රමාණය අඩුවේ. (ලකුණු 02)

එමෙන්ම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය පූර්ණ අනම්‍යතාවයක පැවතිය ද ඉහළ බදු ආදායමක් ලබා ගත හැකි වේ. පාරිභෝගිකයා එවැනි භාණ්ඩවල බද්ධ නිසා මිල වැඩි වුවද ඉල්ලුම් ප්‍රමාණයේ වෙනසක් ඇති නොකරයි. (ලකුණු 02)

iv. (අ) පළමු කන්නයේ අධි සැපයුම

පළමු සැපයුම $= -300 + 6\,(130) - 800 - 4\,(130)$

$= 480 - 280$

$= 200$ කිලෝ දහස්

පළමු කන්නයේ රජයේ පිරිවැය = සහතික මිල × අධි සැපයුම

$= 130 \times 200$

= රුපියල් දහස් 26 000 (ලකුණු 01)

දෙවන කන්නයේ අධි සැපයුම

අධි සැපයුම $= -150 + 6\,(130) - 800 - 4\,(130)$

$= 630 - 280$

$= 350$ කිලෝ දහස්

දෙවන කන්නයේ රජයේ පිරිවැය $= 130 \times 350$

= රුඃ දහස් **45 500** (ලකුණු 01)

පළමු කන්නයට වඩා දෙවන කන්නයේ වියදම රුපියල් දහස් 19 500 කින් වැඩි වී ඇත. (ලකුණු 02)

(ආ) $Q_S = -300 + 6\,(130)$ $\quad$ $Q_S = -150 + 6\,(130)$

$= 480$ $\quad$ $= 630$ (ලකුණු 01)

නිෂ්පාදන අතිරික්තයේ වෙනස = දෙවන කන්නයේ නිෂ්පාදන අතිරික්තය - පළමු කන්නයේ නිෂ්පාදන අතිරික්තය

$= \frac{(130-25)630}{2} - \frac{(130-50)480}{2}$

$= 33\,075 - 19200$

= රුපියල් දහස් 13 875 (ලකුණු 02)

නිෂ්පාදන අතිරික්තය රුපියල් දහස් 13 875 කින් වැඩි වී ඇත. (ලකුණු 01)

**4)**

i. කෙටි කාලීන විචල්‍ය පිරිවැය නිමැවුමක් සමග වෙනස් වන පිරිවැය වේ. එවැනි පිරිවැය නිමැවුම වැඩි වීමේදී වැඩිවන අතර නිමැවුම අඩු වීමේදී අඩුවේ. නිමැවුම ශූන්‍ය වන විට ශූන්‍ය වේ. (ලකුණු 01)

නිමැවුම ශූන්‍ය වූද කෙටිකාලයේ නොවැළැක්විය හැකි අනිවාර්ය පිරිවැය ස්ථාවර පිරිවැයකි. එය නිමැවුම සමඟ වෙනස් නොවේ. (ලකුණු 01)

විචල්‍ය පිරිවැය හා ස්ථාවර පිරිවැය දෙකෙහි එකතුවක් ලෙස මුළු පිරිවැය සමන්විත වේ. ඒ අනුව විචල්‍ය පිරිවැය හා ස්ථාවර පිරිවැය වැඩි වන විට මුළු පිරිවැය ද වැඩි වේ. විචල්‍ය පිරිවැය හා ස්ථාවර පිරිවැය මුළු පිරිවැයට අනුලෝම සම්බන්ධතාවක් පවතී. (ලකුණු 01)

නමුත් විචල්‍ය පිරිවැය හා ස්ථාවර පිරිවැය අතර සම්බන්ධතාවයක් නොපවතී. ස්ථාවර පිරිවැය දෙගුණ වුවද විචල්‍ය පිරිවැය වෙනස් නොවේ. (ලකුණු 01)

ii. ප්‍රාමාණික ලාභ යනු ව්‍යවසායකයෙකු පවත්නා නිෂ්පාදන ක්‍රියාවලියේ රැදී සිටීම සඳහා එම සාධකය විසින් අපේක්ෂා කරන අවම ඉපයීමයි. (ලකුණු 01)
සංක්‍රාම ඉපයීම යනු ඕනෑම නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයේ රඳවා තබා ගැනීමට එම සාධකය අපේක්ෂා කරන අවම ඉපයීමයි. (ලකුණු 01)

මෙය එකම සංකල්පයක් නොව සංකල්ප දෙකකි. ව්‍යවසායකයාගේ ආවස්ථික පිරිවැය ප්‍රාමාණික ලාභය වන අතර ඕනෑම නිෂ්පාදන සාධකයක ආවස්ථික පිරිවැය සංක්‍රාම ඉපයීමයි. (ලකුණු 01)

ව්‍යවසායකයාගේ සංක්‍රාම ඉපයීම පමණක් ප්‍රාමාණික ලාභය වේ. (ලකුණු 01)

iii. දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේදී සාමාන්‍ය පිරිවැය අඩු වීම පරිමානුකුල පිරිමැසුම් වේ.
නමුත් දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වැඩි වීම පරිමාණුකූල නොපිරිමැසුම් වේ. (ලකුණු 04)

iv. කතිපයාධිකාරි ආයතන සමජාතීය භාණ්ඩ නිපදවුවද ප්‍රභේදිත භාණ්ඩය ද නිපදවනු ලබයි. අනෙක් අතට සීමිත ආයතන සංඛ්‍යාවක් ඇති නිසාම තම වෙළඳපොළ කොටස මුළුමනින්ම අහිමි නොවන අයුරින් වෙළඳපොළ මිලට බලපෑම් කිරීමට මෙවැනි ආයතනවලට හැකිවේ. (ලකුණු 02)

වෙළෙඳපොළ සැපයුමෙන් විශාල ප්‍රමාණයක් සීමිත ආයතන වලින් එක් ආයතනයක් සපයන නිසාත් වෙළෙඳපොළ පූර්ණ තොරතුරු නොමැති නිසාත් මිල සකසන්නෙක් වන කතිපයාධිකාරී ආයතන පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයකට මුහුණ නොදී පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙනු ලබයි. (ලකුණු 02)

v. කර්මාන්තයේ වෙළඳපොළ සැපයුම අඩු වීම නිසා මිල ඉහළ යනු ඇත. වෙළඳපොළ මිල ඉහළ යන විට ආයතනයට එය පැවරුණු මිලක් වේ. ඒ නිසා ප්‍රාමාණික ලාභය නිෂ්ප්‍රාමාණික ලාභයක් බවට පත් වේ. එනම් අර්ථික ලාභ උපයනු ලබයි. (ලකුණු 02)

කර්මාන්තයේ වෙළඳපොළ ඉල්ලුම අඩුවීමේදී වෙළඳපොළ මිල අඩු වේ. එවිට එය ආයතනයට පැවරුම් මිලක් වේ. එවිට ආර්ථික අලාභ හිමිවේ. (ලකුණු 02)

5)

i. පෞද්ගලික පරිභෝජන වියදම
රාජ්‍ය පරිභෝජන වියදම
දළ ආයෝජනය
ශුද්ධ ආයෝජනය (ලකුණු 04)


ii. (අ) දේශීය ඉතුරුම් = 4 200
පෞද්ගලික පරිභෝජන වියදම් = 8 600
රාජ්‍ය පරිභෝජන වියදම = 3 200
දළ දේශීය නිෂ්පාදිතය රු: බි: = 16 000

(ආ) දළ දේශීය නිෂ්පාදිතය = 16 000
නිෂ්පාදිතය මත බදු අඩු කළ සහනාධාර = -1 600
මූලික මිල දළ එකතු කළ අගය = 14 400

මිශ්‍ර ආදායම් සහිත දළ මෙහෙයුම් අතිරික්තය = 8 000
නිෂ්පාදනය මත වෙනස් ශුද්ධ බදු = 2 200 -10200
සේවක ආදායම රු: බි: → 4 200 (ලකුණු 02)

(ඉ) පෞද්ගලික ඉතුරුම් = දේශීය ඉතුරුම් - රාජ්‍ය ඉතුරුම්
= 4 200 - (-800)
= රුපියල් බිලියන 5 000 (ලකුණු 02)

iii. කිසියම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ආර්ථිකයක ජාතික ආදායම උච්ඡාවචනවලින් තොරව නොවෙනස්ව එකම මට්ටමක එළඹ සිටීමේ ප්‍රවණතාවය යි. එය පහත අයුරින් නිරූපණය කළ හැක.




සාර්ව ආර්ථික සමතුලිතය අතිවන්නේ ඉහත ප්‍රස්තාරයේ ආදායම් $45^0$රේඛාව සමහාර වියදම් රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යයේදී ය.**Y1** සමතුලිත ජාතික ආදායම වේ (ලකුණු 04)

iv. (අ) සමතුලිත ජාතික ආදායම රුපියල් බිලියන 900 කින් අඩු වේ. (ලකුණු 01)

$\Delta Y = K_{(T)} \times \Delta T$

$= 9 \times 100$

$= 900$ (ලකුණු 01)

(ආ) සමතුලිත ජාතික ආදායම රුපියල් බිලියන 200 කින් වැඩි වේ. (ලකුණු 01)

$\Delta Y = K \times \Delta N_x$

$= 10 \times 20$

$= 200$ (ලකුණු 01)

(ඉ) සමතුලිත ජාතික ආදායම රුපියල් බිලියන 400 කින් අඩු වේ. (ලකුණු 01)

$\Delta Y = K \times \Delta T$

$= 10 \times 40$

$= 400$ (ලකුණු 01)

6)

i. මූර්ත ආදායම
පොලී අනුපාතය
මිල මට්ටම
ආයතනික සාධක
මූල්‍ය ක්‍රමයේ නව්‍යතා
අපේක්ෂා (ලකුණු $1 \times 4$)

ii.

| මුදල් | ආසන්න මුදල් | මුදල් ආදේශක |
|---|---|---|
| A | D | B |
| F | E | C |

ලකුණු 2 ලකුණු 2 ලකුණු 02 → (ලකුණු 06)

iii. ශුද්ධ විදේශ වත්කම් -
මහ බැංකුව සතු
වාණිජ බැංකු සතු

ශුද්ධ දේශීය වත්කම් -
මහබැංකුව රජයට ලබාදුන් ශුද්ධ ණය
වාණිජ බැංකු රජයට ලබාදුන් ශුද්ධ ණය
වාණිජ බැංකු පෞද්ගලික අංශයට ලබාදුන් ණය
අනෙකුත් ශුද්ධ දේශීය වත්කම් (ලකුණු 04)

iv. (අ) අධි සංචිත වලින් සැපයෙන මුළු ණය $= 10 \times 60$
= රුපියල් බිලියන 600

ගුණකය $= \frac{1}{r}$

$= \frac{1}{\frac{10}{100}}$

$= 10$

මුළු ඉල්ලුම් තැම්පතු = පවතින ඉල්ලුම් තැම්පතු + නව ඉල්ලුම් තැම්පතු
= 2 400 + 600
= රුපියල් බිලියන 3 000 (ලකුණු 02)

රු: බිලියන

(ආ) පැවති මුදල් සැපයුම = 3 000
නව මුදල් සැපයුම එකතුවූ නව ඉල්ලුම් තැම්පතු = 600
නව මුදල් සැපයුම = 3 600 (ලකුණු 02)

(ඉ) මුදල් ගුණකය $= \frac{\text{මුදල් සැපයුම}}{\text{පදනම් මුදල් ප්‍රමාණය}}$

$= \frac{3\,600}{900}$

$= 4$ (ලකුණු 02)


පදනම් මුදල් $900\ (600 + 300)$

7)

i. කිසියම් නිෂ්පාදන ක්‍රියාවක් ආශ්‍රයෙන් හටගෙන එම ක්‍රියාවට සම්බන්ධ නැති වෙනත් බාහිර පාර්ශවයකට ඇතිවන නමුත් එම ක්‍රියාව සිදු කරනු ලබන ආයතනය විසින් සැලකිල්ලට නොගන්නා පිරිවැය බාහිර පිරිවැය වේ.

(ලකුණු 01)

නිෂ්පාදනයේ බාහිර පිරිවැයක් ඇතිවන විට අධි නිෂ්පාදනයක් ඇති වී පෞද්ගලික පිරිවැයට වඩා සමාජ පිරිවැය වැඩි වේ. (ලකුණු 01)




ඉහත ප්‍රස්තාරයට අනුව නිෂ්පාදනයේ ඍණ බාහිරතාවයක් ඇතිවන විට සමාජ ප්‍රශස්ත නිමැවුම මට්ටම $Q_1$ ඉක්මවා අධි නිෂ්පාදනයක් $Q_2$ දක්වා ඇති වේ. එහිදී පෞද්ගලික පිරිවැයට වඩා සමාජ පිරිවැය වැඩි වේ. එවිට අහිමිවන සුබසාධනයක් $A$ ලෙස ඇති වේ. (ලකුණු 02)

ii. රජයක් බදු බර ඉසිලීමේ හැකියාව හෙවත් ගෙවීමේ හැකියාව පදනම් කරගෙන බදු අය කළ යුතු වේ. ගෙවීමේ හැකියාවක් නොමැති අයගෙන් බදු අය කිරීම සාධාරණත්වයට පටහැනි වේ.

මෙහිදී ගෙවීමට ඇති හැකියාව මත බදු අය කළ යුතු ය. එහිදි සමාන ආදායම් ලාභීන්ගෙන් සමාන බදු ප්‍රමාණයක් අය කරගැනීම සිරස් සාධාරණත්වය ඉටු කරනු ලබයි.

අසාමාන්‍ය ආර්ථික හැකියා ඇති අයගෙන් අසමාන ලෙස බදු අයකිරීම සිරස් සාධාරණත්වය ඉටු කරනු ලබයි.එහිදි ඉහළ ආදායම්ලාභීන්ගෙන් වැඩි බදු අනුපාතයක් පහළ ආදායම් ලාභීන්ගෙන් අඩු බදු ප්‍රතිශතයක් අය කළ යුතු වේ.

එලෙසම ප්‍රතිලාභ මූලධර්මය ද ක්‍රියාත්මක විය යුතු ය. එනම් රජය සපයන යම් සේවාවල ප්‍රතිලාභ බුක්තිවිඳින පාර්ශව පමණක් පදු ගෙවිය යුතු අතර අන් අයගෙන් බදු අය කිරීම සාධාරණත්වයට පටහැනි වේ.

(ලකුණු 04)

iii. රාජ්‍ය ණය ප්‍රමාණයේ තිරසාරභාවය යලි ස්ථාපිත කිරීම සඳහා අනුගමනය කරනු ලබන වැඩ පිළිවෙලකි. මෙමගින් අපේක්ෂා කරනු ලබන්නේ රජය ලබාගත් සියලු ණය එහි ණය සේවාකරණය හා ණය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස පාලනය කරගත හැකි මට්ටමක පවත්වාගෙන යාමයි.

ඒ සඳහා (ලකුණු 02)

1. මුහුණත වටිනාකම පහත හෙළීම
2. කල් පිරීමේ කාලය දීර්ඝ කිරීම
3. පොලී අනුපාතයේ ගැලපීම් ඇති කිරීම

බොහෝ විට මෙම ක්‍රමවේද තුනම අඩු වැඩි වශයෙන් මිශ්‍ර කොට යොදා ගැනෙන අතර මෙමක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි වුවත් ඒ සඳහා ණය හිමියාගේ අනුමැතිය ලැබිය යුතු ය. (ලකුණු 03)

නොපියවූ ණය ධාරිතාවය

iv. (අ) 2021 රුපියල් ට්‍රිලියන 18

2022 රුපියල් ට්‍රිලියන 27 (ලකුණු 01)

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස,

2021 මහ බැංකු වාර්තාවට අනුව 104.6%

2022 මහ බැංකු වාර්තාවට අනුව 113.2% (ලකුණු 01)

(කරුණු දෙකේ ම දත්ත ලබාදී ඇති නම් ලකුණු 3 ම හිමි වේ.)

(ආ) ශ්‍රී ලංකාවේ ණය ධාරිතාවය 2022 වන විට රුපියල් ට්‍රිලියන 27 ක් වීම හෝ එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 113.8% ලෙස දැක්වීමෙන් ශ්‍රී ලංකාවේ ණය පාෂාණයකට හසු වී ඇති බව සනාථ කළ නොහැකි වේ. එයට හේතුව ලෝකයේ වැඩි ම ණය ලබාගත් රටවල් ණය පාෂාණයකට හසු නොවී පැවතීමයි.

- ශ්‍රී ලංකා රජයේ අයහාරයේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකා රජයේ ණය ප්‍රතිශතය 1 200% ඉක්මවා ඇත. මින් අදහස් වන්නේ ශ්‍රී ලංකා රජය අයහාරය 100 නම් ණය 1 200 පමණ ශ්‍රී ලංකාවේ ණය පවතින බවයි. (2021)
- අනෙක් අතට ශ්‍රී ලංකාවේ ණය සේවාකරණය (ණය වාරිකයක පොළිය) රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට 163 % පමණ වේ. රාජ්‍ය ආදායම රාජ්‍ය ණය වාරික හා පොළිය ගෙවා දැමීමටවත් ප්‍රමාණවත් නැති බව ප්‍රකාශ වේ. (2021)
- රජයක් අයහාරයක් උපයාගනු ලබන්නේ රාජ්‍ය වියදම පියවා ගැනීම සඳහා ය. රාජ්‍ය වියදම් පියවා ගැනීම කෙසේ වෙතත් රාජ්‍ය ආදායමෙන් ණය ගෙවීමටත් නොහැකි තත්ත්වයක ශ්‍රී ලංකාව පවතී මේ නිසා ලබාගත් ණය ගෙවීමට නැවත නැවත ණය ලබාගැනීමට සිදු වේ. ණය සඳහා අනෙක් අයට දේශීය සම්පත් විකිණීමට සිදුව ඇත. මේ නිසා ණය පාෂයකට හසුව ඇති බව සනාථ වේ. (ලකුණු 04)

8)

i. දේශීය ළදරු කර්මාන්ත ආරක්ෂා වීම

ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩ නැගීම

ගෙවුම් ශේෂය යහපත් වීම

විනිමය අනුපාතය යහපත් කරගත හැක වීම

රජයේ බදු ආදායම ඉහළ යාම

ආනයන ආදේශන කර්මාන්ත කරා යොමු විය හැකි වීම (ලකුණු $1 \times 4$)

ii. වෙළඳ ශේෂය යනු භාණ්ඩ ගිණුමේ ශේෂය හෙවත් භාණ්ඩ අපනයන ආදායම් හා භාණ්ඩ ආනයන වියදම් අතර වෙනසයි. වෙළඳ භාණ්ඩ හා මූල්‍ය නොවන රන් වශයෙන් අපනයන ආදායම් ආනයන වියදමට වඩා වැඩි ශේෂය ධන අගයක් ගනු ලබයි.

නමුත් ශුද්ධ අපනයන යනු භාණ්ඩ හා සේවා අපනයන ආදායම හා ආනයන වියදම අතර වෙනසයි

සේවා ගිණුමේ හිගය භාණ්ඩ ගිණුමේ අතිරික්තය ඉක්මවා පවතින විට ශුද්ධ අපනයන ඍණ වේ. (ලකුණු 04)

iii.

| භාණ්ඩ | ***A*** රට | ***B*** රට |
|---|---|---|
| $Y$ | $5 = \frac{5}{20} = \frac{1}{4}$ | $5 = \frac{5}{10} = \frac{1}{2}$ |
| $X$ | $20 = \frac{20}{5} = 4$ | $10 = \frac{10}{5} = 2$ |

(අ) අඩු ම ආවස්ථික පිරිවැයක් හිමි කර ගැනීම නිසා

- $Y$ භාණ්ඩ නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය **A** රටට හිමි වේ.
- $X$ භාණ්ඩ නිපදවීමේ සාපේක්ෂ වාසිය **B** රටට හිමි වේ. (ලකුණු 02)

(ආ) $Y$ භාණ්ඩ සඳහා කිසිදු රටකට නිරපේක්ෂ වාසියක් නැත.

$X$ භාණ්ඩ සඳහා **B** රටට නිරපේක්ෂ වාසිය හිමි වේ. (ලකුණු 02)

(ඉ) $x$ භාණ්ඩයක් හුවමාරු විය යුත්තේ දෙරට අතර $y$ භාණ්ඩ දෙකකට වඩා වැඩි හෝ $y$ භාණ්ඩ 4 කට අඩු අතර ඕනෑම අගයක් ලෙසිනි (ලකුණු 02)

<u>විකල්ප</u>

($Y$ භාණ්ඩයක් හුවමාරු විය යුත්තේ දෙරට අතර $X$ භාණ්ඩ $\frac{1}{4}$ කට වඩා වැඩි $X$ භාණ්ඩ $\frac{1}{2}$ කට අඩු අතර ඕනෑම අගයක් ලෙසිනි.)

iv. ශ්‍රී ලංකාවේ දළ නිළ සංචිතය

| වර්ෂය | එක්සත් ජනපද ඩොලර් බිලියන |
|---|---|
| 2020 | 5.7 |
| 2021 | 3.1 |
| 2022 සැප්තැම්බර් | 1.9 |

මේ තුළ චීන මහජන බැංකුවේ ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් අන්තර්ගත වේ. (ලකුණු 02)

<u>මුහුණදෙන ගැටලු</u>

විනිමය අනුපාතය අවප්‍රමාණය වීමට හේතු වීම, එවිට රජය ලබාගෙන ඇති සමස්ත ණය ධාරිතාවය ද ඉහළ යනු ඇත. 2022 වර්ෂයේ මුල් කාලයේ දී විනිමය අනුපාතය අවප්‍රමාණය වීම නිසා සමස්ත ණය ප්‍රමාණය 37.5% කින් වැඩි වී ඇත.

ණය සේවාකරණය ඉටු කිරීමට නොහැකිව ණය ශ්‍රේණිගත කිරීම්වල පහළ ශ්‍රේණිවලට වැටීම නිසා ජාත්‍යන්තර විශ්වාසය බිඳ වැටීම.

ආනයන හැකියාව අඩු වීමෙන් අත්‍යාවශ්‍ය භාණ්ඩ පවා රට තුළ හිගයක් ඇති වීම

සංචිත වත්කම් ඌනතාවය පියවීමට තවදුරටත් ණය ලබා ගැනීමේදී ණය පාශයකට හසුවීම හා ණය සඳහා පොලී ගෙවීම් ඉහළ යාමෙන් අයවැය හිගය වැඩිවීම

විදේශ සංචිත අවශ්‍යතා සපුරාගැනීම සඳහා දේශීය සම්පත් අලෙවි කිරීමට හා විදේශ රටවලට දේශීය ආර්ථිකය හැසිරවීමට ඉඩ හැරීමට සිදුවීම.

සංචිත ඌණතාවය නිසා විනිමය අනුපාතය පාලනය කරගැනීමට නොහැකිවීමෙන් රටේ දැඩි උද්ධමනකාරී තත්ත්වයක් ඇතිවීම. (ලකුණු $1 \times 4$)

9)

i. පසුගිය වර්ෂයට සාපේක්ෂව සලකා බලන වර්ෂයේ මූර්ත නිෂ්පාදනයේ ඇති වූ ප්‍රතිශතය වැඩි වීම ආර්ථික වෘද්ධි අනුපාතය ලෙස හඳුන්වයි.

$$\text{ආර්ථික වෘද්ධිය අනුපාතය} = \frac{\text{සලකා බලන වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදනය} - \text{පසුගිය වර්ෂයේ මූර්ථ දළ දේශීය නිෂ්පාදනය}}{\text{පසුගිය වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදනය}}$$

ආර්ථික වෘද්ධිය යනු දීර්ඝ කාලයක් තිස්සේ ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාවයේ සිදුවන වැඩි වීමයි. මූර්ත නිමැවුම වසර ගණනාවක් තිස්සේ ඉහළ යන විට එය ආර්ථික වෘද්ධියක් ලෙස හඳුන්වයි. (ලකුණු 02)

ආර්ථික වෘද්ධි අනුපාතය කෙටි කාලීන සංසිද්ධියක් වන අතර ආර්ථික වෘද්ධිය ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාවය දිගුකාලීන වැඩිවීමක් පෙන්නුම් කරයි. ආර්ථික වෘද්ධියක් ඇති වන විට ආර්ථිකයක නිෂ්පදන හැකියා මායිම් වක්‍රය හෝ සමාහාර සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.

(ලකුණු 02)

ii. (අ) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මනිනු ලබන්නේ දරිද්‍රතා ඉම මඟිනි.

ජාතික දරිද්‍රතාව රේඛාව

| | |
|---|---|
| 2019 රුපියල් | 6 966 |
| 2021 රුපියල් | 7 913 |
| 2022 (මාර්තු) රුපියල් | 9 284 |

(ලකුණු 03)

ඒ අනුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයෙන් පෙළෙන ජනගහනය 3042300 ක් පමණ වේ. 2019 (ලකුණු 02)

(ආ) ලෝක දරිද්‍රතා ඉම නිරූපණය කරනු ලබන්නේ දිනකට ඇමරිකානු ඩොලර් 2.15 ලෙස ය. එවිට එය මාසිකව බලන විට රුපියල්වලින් 20 000 ඉක්මවා ඇත.නමුත් 2022 මාර්තු මාසයේදී ජාතික දරිද්‍රතා රේඛාව පෙන්නුම් කරනු ලබන්නේ රුපියල් 9 284 ක් නොලද ජනගහනය දුප්පත් ජනගහනය ලෙසයි.ලෝක දරිද්‍රතා රේඛාවෙන් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මිනුම්කරනු ලැබුවහොත් දුප්පත් ජනගහනය මීට වඩා විශාල වනු ඇත.
2023 වන විට එය පහත අයුරින් වැඩි වේ යැයි සංගණනය කොට ඇත (**economynext**)

| වර්ෂය | ජාතික දරිද්‍රතා අනුපාතය | ග්‍රාමීය | වතු | නාගරික |
|---|---|---|---|---|
| 2019 | 14.3% | 15% | 34% | 6% |
| 2023 | 31% | 32% | 51% | 18% |

(ලකුණු 04)

(111)

මානව සංවර්ධන දර්ශකයේ දර්ශකාංකය 0.800 ට වඩා වැඩි අගයක් සපුරා ගන්නා රටවල් ඉතා ඉහළ මානව සංවර්ධන රටවල් ලෙස හඳුන්වයි. (ලකුණු 02)
ඒ සඳහා

01. උපතේදී ආයු අපේක්ෂාව
02. දැනුම මැනීම සඳහා යොදාගනු ලබන උපදර්ශක
03. ක්‍රයශක්ති සාම්‍ය ඒකපුද්ගල දළ ජාතික ආදායම යන සංරචක

තුන සමාන බර තැබීමෙන් ගණනය කරනු ලබන උප දර්ශක තුනේ දර්ශකය 0.800 ඉක්මවා පැවතිය යුතු ය.
(ලකුණු 03)

**10)**

i.

- අහිතකර ආර්ථික තත්ත්වයන් - ශ්‍රී ලංකාවේ දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හමුවේ ලෝක ආර්ථික තත්ත්වයන් ද මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කිරීම , විශේෂයෙන් ම තොග ලබාගත් රටවල දුර්වල ආර්ථික කාර්ය සාධනය බාධාවක් වේ.
- ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලි ක්‍රියාවට නැංවීමේ අභියෝග
- ශ්‍රී ලංකාවේ විදේශ අංශය මුහුණ දෙන ආවේණික ගැටළු උදෙසා ලබාගන්නා වූ ප්‍රතිපත්ත් ක්‍රියාමාර්ග සඵල නොවීම
- දේශපාලනමය ජනප්‍රිය තීරණ ගැනීම් නිසා කාලීනව දේශපාලන තීරණ වෙනස් කරමින් සිදුවන දේශපාලන අස්ථාවර බව
- දූෂණය, මූල්‍ය විනිවිදභාවය නොමැතිකම නීතියේ ආධිපත්‍යය පිරිහීම ආදි කරුණු වලින් සමන්විතදුර්වල ආයතනික ක්‍රියාකාරීත්වය
- දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තුළින් රටේ මහජනතාව දැඩි පීඩාවට ලක්වීම.
  උදා:- ඉහළ බදු අය කිරීම
  රාජ්‍ය වියදම් කපා හැරීම්
- පොලී අනුපාත ඉහළ දැමීමෙන් ආයෝජන අඩුවීම (ලකුණු 06)

ii. ආර්ථික නිදහස යන්නෙන් අදහස් වන්නේ, ව්‍යාපාරික ආයතනයට පාරිභෝගිකයන්ට හා සාධක හිමියන්ට තමන්ගේ ආර්ථික ක්‍රියාකාරකම්වල නිරතවීමේදී නිදහසක් ඒවාට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමයි
(ලකුණු 02)
ආර්ථික නිදහස ලෝකයේ රටවල් සමඟ සන්සන්දනය කිරීමේ සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ හෙරිටේජ් පදනම ආර්ථික නිදහස පිළිබඳව දර්ශනයක් ගණනය කරනු ලබයි.

එම ස්ථානවල ශ්‍රී ලංකාව පසුවන්නේ ඉතා දුර්වල මට්ටමකය. එහි ප්‍රවනතා පහකින් දැක්වේ. 2022 වර්ෂයේදී රටවල් 176 කින් ශ්‍රී ලංකාවේ 136 ස්ථානයේ පසුවීමෙන් එහි දුර්වලතාවය හඳුනාගත හැකිය. (ලකුණු 02)
මෙමගින් නිරූපණය වන්නේ,
ව්‍යාපාරික නිදහස
වෙළෙඳාමේ නිදහස
රජ්‍ය මූල්‍ය නිදහස
ආයෝජනයේ නිදහස
දූෂණයෙන් නිදහස්වීම
දේපළ පිළිබඳ නිදහස

මෙවැනි කරුණු අතින් ශ්‍රී ලංකාවේ පවත්නා වූ නිදහස දුර්වල මට්ටමක පවතින බවයි.

(ලකුණු 02)

iii. ගැටළු

- විදේශ සංචිත ඌනතාවය , විදේශ සංචිතය ප්‍රමාණවත් නොවීමෙන් සියලු ආර්ථික අර්බුදයන් ඇතිවිය රාජ්‍ය ණය වාරිකය ඉහළයාම හා ණය පාර්ෂවයකට හසුවීම
- ණය සේවාකරණය ඉටු නොකිරීමෙන් ණය ශ්‍රේණිගත කිරීම්වලට පහළ මට්ටමක වැටීමෙන් ජාත්‍යන්තර විශ්වාසය පළුදුවීම
- උද්ධමනය අනුපාතය අඩු වුවද උද්ධමනය ආර්ථිකයේ සියලු පාරිභෝජන පිරිවැය හා නිෂ්පාදන පිරිවැය ඉහළ නැංවීමට හේතු විම.
- විනිමය අනුපාතය දිගින් දිගටම ක්ෂයවීම හා ජංගම ගිණුමේ හිගය දීර්ඝකාලයක් තිස්සේ පැවතීම
- අයවැය හිගය විශාල හිගයක් ලෙස වාර්තාවීම
- විරැකියාව සහ බුද්ධිගලනය
- දළ දේශීය නිෂ්පාදිතය අඩුවීම 2022 වර්ෂයේදී එය සෘණ අගයක් වාර්තාවීම
- කොපමණ බදු අය කළ ද බදු ආදායම සුළු කොටසක් පරිදි ඉහළ ගෙන යාම හා බදු වංචා සුළඹවීම
- වංචා හා දූෂණය තුළින් අයතනික ව්‍යුහය දුර්වලවීම හා එහි බර මහජනයා මත පතිතවීම (ලකුණු 04)

විසඳුම්

- දූෂණය වැලැක්වීම හා නීතියේ ආධිපත්‍ය ස්ථාපිත කිරිම
- කොල්ලකන ලද වත්කම් අත්පත් කර ගැනීම
- බදු පැහැර හරින්නන් සඳහා දැඩි නීති ක්‍රියාත්මක කිරීම
- බදු පරිපාලනය කාර්යක්‍ෂම කිරීම
- විදේශ ආයෝජනය ප්‍රවර්ධනය කරගැනීම තුළින් ගෙවුම් ශේෂය යහපත් කර ගැනීම
- ණය ප්‍රතිව්‍යුහගතකිරීමේ වැඩසටහන ක්‍රියාවට නැංවීම
- රාජ්‍ය ව්‍යවසායක ප්‍රතිව්‍යුහ කිරීම
- යහපාලනය ඇති කිරිම
- විදේශ සේවා නියුක්ති ප්‍රේෂණ ගෙන්වා ගැනීමට ආකර්ෂනීය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම
- සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය
- නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් පවත්වාගෙන යාම
- දේශීය ආයෝජනය ප්‍රවර්ධනය (ලකුණු 04)